OL/2009/12-S-I,II

සියලු ම හිමිකම් ඇවිරිණි]
முழுப் பதிப்புரிமையுடையது]
All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

12 | S | I, II

අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය, 2009 දෙසැම්බර්
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை, 2009 டிசெம்பர்
General Certificate of Education (Ord. Level) Examination, December 2009

ශෛවනෙරි I, II
சைவநெறி I, II
Saivaneri I, II

පැය තුනයි
மூன்று மணித்தியாலம்
*Three hours*

## ශෛවනෙරි I

සැලකිය යුතුයි :

(i) සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
(ii) අංක 1 සිට 40 තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් නිවැරදි හෝ වඩාත් ගැළපෙන හෝ පිළිතුර තෝරා ගන්න.
(iii) ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන් ඔබ තෝරාගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.
(iv) එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා පිළිපදින්න.
(v) **I හා II පිළිතුරු පත්‍ර එක් පිළිතුරු පත්‍රයක් වන සේ එකට අමුණා භාර දෙන්න.**

1. විනායග දෙවියන්ගේ ආශිර්වාදය ලැබ තිල්ලෙයිල් කෝවිලෙහි සිරවී තිබූ තේවාරම්වල මුල් පිටපත නැවත ලබා ගත්තේ
(1) නම්බියාන්ඩාර් නම්බි ය. (2) අරුණගිරිනාදර් ය.
(3) තිරුමන්කෙ ආල්වාර් ය. (4) සේක්කිලාර් ය.

2. ආරම්භයක් සහ අවසානයක් නොමැති වන්නේ
(1) දේවතාවන් ය. (2) දෙවියන් ය. (3) මුනිවරු ය. (4) ඉන්ද්‍ර ය.

3. ශිව උපවාස කිහිපයක නම් සඳහන් කාණ්ඩය තෝරන්න.
(1) කන්තසෂ්ටි, මහා ශිවරාත්‍රී, පෙරුන්ගතෙ (2) කේතාරගෞරි විරදම්, තෛපූසම්, මායිමහම්
(3) ශිවරාත්‍රී, කේතාරගෞරි විරදම්, ප්‍රදේශ විරදම් (4) තිරුප්වෙම්පාවෙ, පංගුනිතිංගල්, නවරාත්‍රී

4. දෙවියන්ගේ කාර්යය පහ
(1) බ්‍රහ්ම, විෂ්ණු, රුද්‍රා, මහේෂ්වරන්, සදසිවන්
(2) අරුවම්, උරුවම්, අරුඋරුවම්, තිරුප්පේරු වඩිවම්, විෂ්වරූපම්
(3) නල්විනෛ, තිවිනෛ, ආනවම්, කන්මම්, මායෙයි
(4) මැවීම, ආරක්ෂාව, විනාශ කිරීම, නිරීක්ෂණය, කරුණාව දක්වීම

5. ඖෂධ ගැල්වූ ජලය ස්නානය කර අලුත් ඇඳුම් ඇඳගෙන සමරනු ලබන උත්සවය වන්නේ
(1) තෛපොංගල් ය. (2) අප්‍රේල් අලුත් අවුරුද්ද ය. (3) දීපාවලී ය. (4) ආඩිප්පිරප්පු ය.

6. තිරුඥානසම්බන්දර්, තිරුනාවුක්කරසර්, සුන්දරර් ගේ තේවාරම් ගීත හැඳින්වෙන්නේ
(1) තිරුවාසගම් ලෙස ය. (2) තිරුප්පුගල් ලෙස ය. (3) සිවඥානපෝදම් ලෙස ය. (4) තේවාරම් ලෙස ය.

7. කෝවිලට යාමෙන් පසු සන්දේශවරර් වන්දනා කිරීම හා ඔහුගෙන් ශිවපූසෙය ආශිර්වාදය ලබාදෙන මෙන් අයදිනු ලැබේ. මොහු වන්දනා කිරීමේ ක්‍රමය වන්නේ
(1) තෙවරක් අත්පුඩි ගැසීමෙන් පසු වන්දනා කිරීම ය. (2) දෙඅත් නමා වන්දනා කිරීම ය.
(3) ප්‍රදක්ෂිණා කිරීම ය. (4) වාඩි වී භාවනා කිරීම ය.

8. නව ග්‍රහ වන්දනා කරමින් ගායනා ලබන තේවාරමක් වන්නේ
(1) "වේයුරු තෝලි පන්ගන්..." (2) "තිරුකෝයිල්ඉල්ලාද තිරුවි ඌරුම්..."
(3) "සංගනිති පදුමනිති ඉරෙන්ඩුම්..." (4) "විනායගනේ වෙව්විනෛයෙ වේරරුක්ක..."

9. සේක්කිලාර් විසින් රචනා කරන ලද පුරාණම් වන්නේ
(1) තිරුවිලෛයාඩත් පුරාණම් ය. (2) තිරුවාදවුරඩිකල් පුරාණම් ය.
(3) තිරුත්තොන්ඩර් පෙරිය පුරාණම් ය. (4) සිව පුරාණම් ය.

10. ආල්වාර් දොළොස්දෙනාගෙන් දෙදෙනෙක් වන්නේ
(1) සම්බන්දර් හා සුන්දරර් ය. (2) විවේකානන්දර් හා විපුලානන්දර් ය.
(3) සේන්දනාර් හා කාරෙකොලම්මෙයාර් ය. (4) පෙරියාල්වාර් සහ ආන්ඩාල් ය.

[ දෙවැනි පිටුව බලන්න.

11. ශ්‍රී ලංකාවේ තිරුකේතීශ්වරම් සහ තිරුකෝනේෂ්වරම් හිඳී තේවාරම් ගීත ගායනා කරනු ලැබුවෙක් වන්නේ
(1) අරුනගිරිනාදන් ය. (2) තිරුනාවුක්කාරසර් ය. (3) තිරුඥානසම්බන්ධර් ය. (4) මානික්කවාසගර් ය.

12. සුන්දරර් සඳහන් කෙරෙන පද්‍යයක පේළියක් වන්නේ
(1) "පූලියර්කෝන් වෙජ්පෝලිත්ත පුගලියර්කෝන්..." (2) "ආලිම්සෙ කන්මිදප්පිල් අමර්න්ද පිරාන්..."
(3) "වාලිතිරුනාවලූර් වන්රෝන්ඩර්..." (4) "වාලිසිත්තාන්ද තන්දුවඥනිගල්..."

13. සන්තාන කුරවර් යනු
(1) වේදන්ත දර්ශනිකයෝ ය. (2) ශෛව නායන්මාර් ය.
(3) පූජනීය ස්තෝත්‍රවල රචකයෝ ය. (4) ශෛව සිද්ධාන්ත දර්ශනිකයෝ ය.

14. ශෛව කෝවිල්වල පවත්වනු ලබන උත්සවය
(1) දෙවියන්ගේ කාර්ය පහ දක්වයි. (2) මැවීමේ දේව ක්‍රියා දක්වයි.
(3) කෝවිල්වල අධික ධනය පෙන්වයි. (4) දිව්‍ය මූර්තියේ පරම චරිතය පෙන්වා දෙයි.

15. ශෛව භක්තිකයාට මාංශ අනුභවයට අවසර නොදෙන්නේ
(1) නොමැරීම එක් ශ්‍රේෂ්ට කුසලයක් ලෙස සැලකීම නිසා ය.
(2) සත්‍යය ඉහළ ම ධර්මයක් ලෙස පිළිගන්නා නිසා ය.
(3) මස් මිල අධික නිසා ය.
(4) මස් මිලදී ගැනීම ඉතා අපහසු නිසා ය.

16. ශෛව භක්තිකයින් එකිනෙකා හමුවූ විට පළමුවෙන් ඔවුන්
(1) ස්වල්ප වේලාවක් නිශ්ශබ්දව සිටිය යුතු ය. (2) එකිනෙකාගෙන් ඉවතට යා යුතු ය.
(3) දෙඅත් නමා එකිනෙකාට ආචාර කළ යුතු ය. (4) අතට අත දී ගමන පිළිබඳ විමසිය යුතු ය.

17. පූජනීය කෝවිලේ ඉටුකරනු ලබන්නේ මොනවා ද?
(1) කාන්තාවන් විසින් අංග ප්‍රදක්ෂිණා කිරීම ය. (2) පුරුෂයින් විසින් පංචාංග නමස්කාර කිරීම ය.
(3) එහෙ මෙහේ දිවීම හා සෙල්ලම් කිරීම ය. (4) නිශ්ශබ්දතාව රැකීම ය.

18. තිරුවරුඩ්පයම් හි කතුවරයා වන්නේ
(1) මෙකන්ද තේවර් ය. (2) උමාපතිසිවාසාරියාර් ය. (3) මරෛඥන සම්බන්දර් ය. (4) අරුණන්දි සිවාචාරියාර් ය.

19. දෙවියන්ගේ තත්ත්ව දෙක වන්නේ
(1) තඩත්තනිලෙ හා සොරුපනිලෙ ය. (2) මුන්නිලෙ හා පඩර්කෙනිලෙ ය.
(3) අරුවම් හා උරුවම් ය. (4) මහේෂ්වරන් හා සතාසිවන් ය.

20. වල්ලිපුර ආල්වාර් කෝවිලේ කරුවරෙ හි ස්ථාපනය කර ඇති ප්‍රතිමාව
(1) විෂ්ණු හිටි පිළිමය වේ. (2) ශක්‍රයා වේ.
(3) සිවලිංගය වේ. (4) නාගතම්බිරාන් වේ.

21. වරදපන්ඩිදර් ලන්දේසි යුගයේ දී ශ්‍රී ලංකාවේ ශෛව ධර්මයේ පැවැත්මට දයක වූ අයෙකි. ඔහු විසින් රචිත ග්‍රන්ථ
(1) සිවරාත්‍රි පුරාණම් හා ඒකදසි පුරාණම් වේ.
(2) තිරුක්කරසෙ පුරාණම් හා පරාලෙ විනායගර් පල්ලු වේ.
(3) කල්වලෙයන්තාදි හා මරෙසෙයන්තාදි වේ.
(4) දක්ෂිණ කෛලාෂ පුරාණම් හා තිරුවිවෙන්දූර් පුරාණම් වේ.

22. ශ්‍රී ලංකාවේ ආදිවාසීන් වූ යක්ෂ හා නාග ගෝත්‍රිකයෝ
(1) ස්වභාව ධර්මයට වැඳුම් පිදුම් කළෝ ය. (2) සිව දෙවියන්ට වැඳුම් පිදුම් කළෝ ය.
(3) ශක්ති ඇදහිලි පිළිපැද්දේ ය. (4) කිසි ම දෙවියෙකු ඇදහුවේ නැත.

23. ශෛව භක්තිකයින් ලෙස අපේ කටයුතු
(1) සම්පූර්ණයෙන් ම අපගේ යහපතට හේතු විය යුතු ය. (2) අපට මෙන් ම අනුන්ට යහපතක් ගෙන දිය යුතු ය.
(3) ස්ව පෙලඹවීමක් ඇතිව පවත්වාගෙන යා යුතු ය. (4) අනුන් පැරදවීමේ ආත්ම අරමුණින් සිදු විය යුතු ය.

- පහත සඳහන් වගුවේ තොරතුරු භාවිත කර අංක **24** සහ **25** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

| විරදම් | කාර්යයන් | විශේෂ ලක්ෂණ |
|---|---|---|
| A. පූලි අමාවක | D. දෙවියන් උදෙසා භාවනා කිරීම | G. දෙමව්පියන් සිහිකර පූදපූජා පැවැත්වීම |
| B. අප්‍රේල් පසළොස්වක පොහොය | E. උපවාසය රැකීම | H. අප්‍රේල් කැඳ සැකසීම |
| C. කන්තසස්ති විරදම් | F. ශුද්ධ පවිත්‍රවීම සඳහා ස්නානය | I. සූර සංකාරම් |

24. මියගිය පියාගේ ආත්මය සැනසීම හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) A, E, I (2) A, F, G (3) B, E, I (4) C, E, H

25. මුරුගන් දෙවියන් හා සම්බන්ධ කාණ්ඩය කුමක් ද?
(1) B, E, G (2) A, E, H (3) C, E, I (4) C, F, H

26. "ආදරය හා සිවම් වෙනස් බවින් යුක්ත දෙකක් බව අඥනයින් පවසයි." - (තිරුමූලර්)
මෙම ප්‍රකාශයෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද?
(1) ආදරය සිවම්ගෙන් වෙනස් වේ. (2) ආදරය හා සිවම් එකිනෙකට වෙනස් නොවේ.
(3) කිසි ම දෙයක් තේරුම් ගත නොහැකි වේ. (4) මෙම ප්‍රකාශය ශෛව ධර්මයට අදළ නොවේ.

27. විවාහය හා සම්බන්ධ ධර්මය වන්නේ
(1) තපස ය. (2) ගෘහ ජීවිතය ය. (3) බ්‍රහ්මචාරී වීම ය. (4) වානප්‍රස්තම් ය.

28. සකලකලාවල්ලි මාලෙ ගායනා කරනු ලැබුවේ
(1) දුර්ගාගේ කරුණාව ලබා ගැනීම සඳහා ය. (2) ලක්ෂ්මිගේ උපකාර ලබා ගැනීම සඳහා ය.
(3) සරස්වතිගෙන් ආශිර්වාද ලබා ගැනීම සඳහා ය. (4) තිරුමගල්ගෙන් ආශිර්වාද ලබා ගැනීම සඳහා ය.

29. "කෝලමා මඥ්ඥෙයි තන්නිර් කුලවිය කුමරන් තන්නෙ..." යන කන්තපුරාණම් හි කාව්‍යයන්ගෙන් විස්තර කරනු ලබන සත්‍යය
(1) මුරුගන් හා සිවන් එක් අයෙකු වන බවයි. (2) මුරුගන් හා සිවන් එකිනෙකාට වෙනස් බවයි.
(3) මුරුගන් හා විෂ්ණු එක් අයෙකු බවයි. (4) මුරුගන් බ්‍රහ්මට සෑම අතින් ම සමාන බවයි.

30. මනුෂ්‍යයාගේ මම, මගේ යන විඥනය සඳහා හේතුව වන්නේ
(1) මායෙය ය. (2) කන්මම් ය. (3) ආනවම් ය. (4) දෙවියන් ය.

31. වන්දනා ගමනක් යනු
(1) විනෝද ගමනකි.
(2) නිවාඩුව ගත කිරීම සඳහා යොද ගන්නකි.
(3) ශිෂ්‍යයින්ට එකට හමුවී විනෝදයෙන් ගී ගයමින් නටමින් කාලය ගතකිරීම සඳහා දෙනු ලබන අවස්ථාවකි.
(4) සිතේ සාමය හා ගුණධර්ම සංවර්ධනය සඳහා දෙවියන් කෙරෙහි භක්තිය වැඩි දියුණු කිරීමකි.

32. 'සරියෙයි' සේවය ඉටුකර මෝක්ෂ සුවය ලබා ගත්තේ
(1) සම්බන්දර් ය. (2) අප්පර් ය. (3) සුන්දරර් ය. (4) මනිවාසගර් ය.

33. නාවලර් මනිමන්ඩපම් ඇත්තේ
(1) කොළඹ ය. (2) මඩකලපුවේ ය. (3) නල්ලූර්හි ය. (4) වන්නාර්පනෙහි ය.

34. "දෙවියන් සිහිකරමින් උදයන අවදිවීමෙන් ඔබේ උදය හා සවස කටයුතු ගැටලුවකින් තොරව සිදුකළ හැකි ය. ආහාර අනුභවයට පෙර දෙවියන් සිහි කළ යුතු ය." (චිත්තානෙකුට්ටි ස්වාමිගල්)
මෙම ඉගැන්වීම
(1) ජීවිතයේ දියුණුවට ප්‍රයෝජනවත් වේ. (2) වර්තමානයේ පවතින තත්ත්වයට අදළ නොවේ.
(3) ප්‍රායෝගික නොවේ. (4) බොහෝ යල් පැනගිය එකකි.

35. පොළොව, ජලය, ගින්දර, වාතය සහ අහස යන පහ
(1) ඉන්ද්‍රිය අවයව ය. (2) මූලධාතුන් ය. (3) තන්මාත්‍රා ය. (4) සිවතත්තුවම් ය.

36. සාමාන්‍යයෙන් ජන ඇදහිලි
(1) ආගම් හා සම්බන්ධ නොවේ. (2) ආගමම් හා සම්බන්ධ වේ.
(3) ආගමම් හා සම්බන්ධ නොවේ. (4) වේද ලක්ෂණයක් වේ.

37. ප්‍රසිද්ධ කෝවිල් වන මුරිකන්ඩි හා වට්ටාප්පලෙ
(1) සිව හා අම්බාල් කෝවිල් වේ. (2) කන්නගි හා මුරුගන් කෝවිල් වේ.
(3) පිල්ලෙයාර් හා සිව කෝවිල් වේ. (4) පිල්ලෙයාර් හා කන්නගි අම්මන් කෝවිල් වේ.

38. මූර්ති, තලම්, තීර්තම් තිබිය යුත්තේ
(1) නිවසේ ය. (2) කෝවිලේ ය. (3) පාසලේ ය. (4) මඩම්හි ය.

39. සමකාලීන ආගමික ආචාර්යවරුන් වන්නේ
(1) මෙකන්ඩ තේවර් හා අරුනන්දිසිවාචාරියර් ය. (2) සුන්දරර් හා මානික්කවාසගර් ය.
(3) තිරුඥනසම්බන්ධර් හා තිරුනාවුක්කරසර් ය. (4) අප්පර් හා සුන්දරර් ය.

40. පාලාවි, පාවනාසම්, සිත්තාමිර්දපුට්කරනි යනු පූජනීය
(1) ස්ථාන ය. (2) වෘක්ෂ ය.
(3) ග්‍රන්ථ ය. (4) ස්නානය සඳහා වූ ස්ථාන ය.

* *

[ හතරවැනි පිටුව බලන්න.

## ශෛවනෙරි II

※ **පළමුවන** ප්‍රශ්නය හා **දෙවන** ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න. ඊට වැඩියෙන් ලියා ඇති පිළිතුරු, අයදුම්කරු විසින් කපා හැර නොමැති අවස්ථාවල දී ලකුණු නොකර ම කපා හරිනු ලැබේ.

※ පළමුවන ප්‍රශ්නය සඳහා ලකුණු **20** ක් ද දෙවන ප්‍රශ්නය සඳහා ලකුණු **16** ක් ද අනෙකුත් ප්‍රශ්න සඳහා ලකුණු **08** බැගින් හිමි වේ.

1. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
   (i) ඕනෑම ක්‍රියාවක් දෙවියන් ඇදහීමෙන් ආරම්භ කරන විට අපට ලබා ගත හැකි ප්‍රතිලාභය කුමක් ද?
   (ii) මනුෂ්‍ය අගයයන් **හතරක්** සඳහන් කරන්න.
   (iii) අප්‍රේල් මාසයේ අලුත් අවුරුදු දිනයේ දී සිදුකරනු ලබන සුභ වැඩ කටයුතු **හතරක්** සඳහන් කරන්න.
   (iv) තිරුමුරෙ සම්පාදනය කළේ කවුද? එම කාර්යය කිරීම සඳහා හේතු වූයේ කවුරුන් ද?
   (v) අප්පර් හා මානික්කවාසගර් විසින් අනුගමනය කරනු ලැබූ මාර්ග මොනවා ද?
   (vi) ආත්මය බැඳ ගන්නා සම්බන්ධකම් (පාසංගල්) මොනවා ද?
   (vii) සංගම වන්දනාව යනු කුමක් ද?
   (viii) ශෛවනෙරි හි විශේෂ ලක්ෂණ **දෙකක්** නම් කරන්න.
   (ix) පාසලෙහි ආගමික වැඩසටහන් පැවැත්වීමෙන් ශිෂ්‍යයින්ට ලබා ගත හැකි ප්‍රතිලාභ **දෙකක්** සඳහන් කරන්න.
   (x) ශෛව භක්තිකයින් විසින් අනුගමනය කළයුතු හොඳ පුරුදු **හතරක්** සඳහන් කරන්න.

2. (අ) පහත සඳහන් පද්‍යවලින් **දෙකක්** නිවැරදි පිළිවෙළින් සම්පූර්ණ කරන්න.
   (ආ) ඒවායෙහි අර්ථය කෙටියෙන් සඳහන් කරන්න.
   (i) 'වේයුරු තෝලිපන්කන් …'
   (ii) 'මාරිනිත් රෙන්නෙ මයක්කිවුම් …'
   (iii) 'විනායගනේ වෙව්විනෛයෙ …'
   (iv) 'භක්තියාල් යානුනෛප් …'
   (v) 'සිව සිව එන්කිලර් …'

3. "සිත යොමු කරවනු ලබන මාවත දිගේ යාම වළක්වමින් හොඳ සිහියෙන් යුතුව වචනයෙන් හා ක්‍රියාවෙන් දෙවියන් නැමදීම හා ආහාර අනුභවය අඩු කිරීමෙන් හෝ වැළකීමෙන් සිටීම උපවාසය (විරදම්) වේ." (නාවලර් පෙරුමාන්)
   (අ) උපවාසයේ යෙදීමේ පරමාර්ථය කුමක් ද? විනායග දෙවියන් නැමදීම සඳහා කරනු ලබන උපවාස **දෙකක්** සඳහන් කරන්න.
   (ආ) තෛපූසම් හි අසහාය ලක්ෂණ සඳහන් කර එම අවස්ථාවේ දී කරනු ලබන ක්‍රියාවන් හා කුසල් සඳහන් කරන්න.
   (ඉ) 'සූරසංකාරම්' යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? එහි සත්‍ය වැදගත්කම කුමක් ද?

4. "තන්නිලෙයිමෙ මන්නුයිර්කල් සාරත් තරුන්ශක්ති
   පින්තම්ලාත් එංගල් පිරාන්." (තිරුවරුඩ්පයන්)
   (අ) 'තිරුවරුඩ්පයන්' හි කතුවරයා කවුද? ඔහුගේ ගුරුගේ නම කුමක් ද? තිරුවරුඩ්පයන්හි පරිච්ඡේද ගණන කොපමණ ද?
   (ආ) ශක්තිපින්තම්ලාත් යනුවෙන් විස්තර කෙරෙන්නේ කවුද? ඔහු ගැන මෙලෙස සඳහන් කෙරෙන්නේ කුමක් නිසා ද?
   (ඉ) මුප්පොරුල්හල් **තුන** මොනවා ද? දෙවියන්ගේ තත්ත්ව **දෙකක්** කෙටියෙන් විස්තර කරන්න.

5. "පූලියර්කෝන් වෙප්පොලිත්ත පුහලියර්කෝන් කලල් පෝට්ටි"
   (අ) පූලියර්කෝන් යනු කවුද? පුහලියර්කෝන් යනු කවුද?
   (ආ) ඥානසම්බන්දර්ගේ ප්‍රථම තේවාරම කුමක් ද? එය ගායනා කරනු ලැබුවේ කවදා ද?
   (ඉ) තිරුඥානසම්බන්දර් විසින් දක්වූ ආශ්චර්යයන් **දෙකක්** සඳහන් කරන්න. ඔහු විසින් ශ්‍රී ලංකාවේ කෝවිල් කීයක් පිළිබඳ දේවස්තෝත්‍ර රචනා කර ඇත් ද?

6. "ආලයන් තොලුවදු සාලවුම් නන්රු …"
   (අ) දක්ෂිණ කෛලායම් නමින් හඳුන්වනු ලබන කෝවිල කුමක් ද? එය එසේ හැඳින්වීමට හේතුව කුමක් ද? එය විස්තර කරනු ලබන ග්‍රන්ථය කුමක් ද?
   (ආ) තාන්තෝන්රිවරම් යනුවෙන් ඔබ අදහස් කරන්නේ කුමක් ද? එම නමින් හඳුන්වනු ලබන ශ්‍රී ලංකාවේ ඇති කෝවිල් **දෙකක** නම් ලියන්න.
   (ඉ) තිරුකෝනේෂ්වර හි ඇති මූර්ති හා තලම් පිළිබඳ විශේෂ ලක්ෂණ කෙටියෙන් ලියන්න.

7. පහත සඳහන් ඒවායින් ඕනෑම **දෙකක්** පිළිබඳ කෙටි සටහන් ලියන්න.
   (අ) පාසල්වල ආගමික උත්සව පැවැත්වීමේ වැදගත්කම
   (ආ) ආඩිප්පිරප්පු
   (ඉ) යෝගර්ස්වාමිගල්
   (ඊ) නවරාත්‍රී
   (උ) "ප්‍රජාවට සේවය කිරීම දෙවියන්ට සේවය කිරීමකි"

※※※